කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) -2016/2017

**PSC -3161 - ස්ත්‍රී පුරුෂ සමාජභාව දේශපාලනය : න්‍යාය සහ සංකල්ප**

කාලය : පැය දෙකයි (02)

ප්‍රශ්න තුනකට ( 03 ) පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20).**

---

01. පහත සඳහන් දෑ උදාහරණ සහිත ව පහදන්න.

(අ) ලිංග හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය

(ආ) ස්ත්‍රී පුරුෂ සමාජභාව බල සබඳතා සංස්කෘතික නිෂ්පාදනයක් වශයෙන්

02. රැඩිකල් හා මාක්ස්වාදී ස්ත්‍රීවාදී පර්යාලෝක තුළ පීතෘමූලිකත්වය ප්‍රකාශ වන්නේ කුමන මට්ටමකින් ද? සාකච්ඡා කරන්න.

03. පහත සඳහන් දෑ සාකච්ඡා කරන්න.

(අ) ලිංගක ශ්‍රම විභජනය යනු කුමක් ද?

(ආ) නූතන සමාජයේ ලිංගික ශ්‍රම විභජනය වෙනස් වී ඇත්තේ කෙසේ ද?

04. (අ) ලෝකයේ ජාතික පාර්ලිමේන්තු තුළ ස්ත්‍රී නියෝජනයේ ස්වභාවය පහදන්න.

(ආ) දේශපාලනයට ස්ත්‍රීන්ගේ මැදිහත් වීම වැඩි දියුණු කිරීමට ඔබ යෝජනා කරන්නේ මොනවා ද?

05. තුර්කියේ මුස්තාපා කෙමාල් (Mustafa Kemal) කාලවකවානුව තුළ විමුක්තිය සඳහා වූ ස්ත්‍රී අරගල විභාග කරන්න.

( අ.පි.බ.)

06. **එක්කෝ**

(අ) දකුණු ආසියාවේ ස්ත්‍රී විමුක්ති ව්‍යාපාර පහදන්න.

**නැතහොත්**

(ආ) යුද්ධ ගැටුම්වලදී සෘජු හෝ වක්‍ර ලෙස ස්ත්‍රීන් හිංසනයට ලක්වන්නේ කෙසේ ද?

උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.

07. පහත සඳහන් ඕනෑ ම මාතෘකා **දෙකක් (02)** පිළිබඳ ව සටහන් ලියන්න:

(අ) ස්ත්‍රීවාදයේ දෙවන රැල්ල

(ආ) ලිබරල් ස්ත්‍රීවාදය

(ඇ) ස්ත්‍රී පුරුෂ සමාජභාව සමාජානුයෝජනය

(ඈ) මනෝවිශ්ලේෂණාත්මක ස්ත්‍රීවාදය

***************************